ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා)උපාධි වැඩසටහන-හයවන මට්ටම 2016/2017

අවසාන පරීක්ෂණය - 2018

තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු - ESU4216

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2018.02.01 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපනය විෂයය හැදෑරීමෙන් ගුරුවරයකුහට අත්වන ප්‍රයෝජන පහක් (05) ලැයිස්තුගත කරන්න.

02. දකුණු අප්‍රිකාවෙහි වර්ණ භේද ප්‍රතිපත්තිය එරට අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑ ආකාරය පිළිබඳ කරුණු තුනක් (03) සඳහන් කර, ඉන් එකක් (01) කෙටියෙන් විස්තර කරන්න.

03. ජාතික මට්ටමේ භාෂා ප්‍රතිපත්තියකින් ඉටු වන කාර්යයන් පහක් (05) සඳහන් කරන්න.

04. පැරණි ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයෙහි දක්නට ලැබුණු ධනාත්මක ලක්ෂණ තුනක් (03) සහ ඍණාත්මක ලක්ෂණ දෙකක් (02) සඳහන් කරන්න.

05. 19 වන සියවසෙහි මුල් දශක දෙක තුළ ශ්‍රී ලංකාවට පැමිණි මිෂනාරි කණ්ඩායම් තුනක් (03) නම් කර ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය කෙරෙහි එම මිෂනාරි කණ්ඩායම්හි දායකත්වය කෙටියෙන් විස්තර කරන්න.

06. 1943 අධ්‍යාපනය පිළිබඳ විශේෂ කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ පහක් (05) සඳහන් කරන්න.

07. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ දක්නට ඇති ගුරු අධ්‍යාපනය හා සම්බන්ධ ගැටලු තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

08. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන කොමිසම විසින් ඉදිරිපත් කර ඇති ජාතික අපේක්ෂණ **පහක් (05)** ලැයිස්තුගත කරන්න.

( ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) බ්‍රිතාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ දක්නට ලැබෙන පාසල් වර්ගීකරණය කිරීමෙහි දී සලකා බැලෙන ප්‍රධාන කරුණු **දෙක (02)** නම් කර ඒ එක් එක් කරුණ යටතේ තිබෙන පාසල් වර්ග **එක (01)** බැගින් ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) 1944 බට්ලර් අධ්‍යාපන පනත මගින් හඳුන්වා දෙන ලද ත්‍රෛපාර්ශවික පාසල් ක්‍රමය ක්‍රියාත්මක වූ ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ ත්‍රෛපාර්ශ්වික පාසල් ක්‍රමයෙහි ප්‍රබලතා සහ දුබලතා සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) සංවර්ධිත රටවල අධ්‍යාපනයෙහි නව ප්‍රවණතා **හතරක් (04)** සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඉහත අංක (i) යටතේ ඔබ සඳහන් කළ එක් ප්‍රවණතාවක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(iii) ඉහත ඔබ සඳහන් කළ නව ප්‍රවණතා ශ්‍රී ලාංකික සන්දර්භයට ගළපා ගත හැක්කේ කෙසේදැයි විමසන්න. (ලකුණු 10)

11. (i) සංවර්ධනය යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින අධ්‍යාපනික ගැටලු **හතරක් (04)** සඳහන් කර ඉන් **දෙකක් (02)** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාවෙහි බාහිර කාර්යක්ෂමතාව පිළිබඳව පවතින ගැටලු විසඳීම සඳහා ඔබගේ යෝජනා **හතරක් (04)** ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

12. (i) ගෝලීයකරණය යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණය ශ්‍රී ලංකාවට බලපා ඇති ආකාරය

(අ) ධනාත්මක ප්‍රතිඵල දෙකක් **(02)**

(ආ) සෘණාත්මක ප්‍රතිඵල එකක් **(01)**

ඔස්සේ කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ගෝලීයකරණයේ ධනාත්මක ප්‍රවණතා ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය සංවර්ධනය කිරීමට යොදාගත හැකි ආකාරය උදාහරණ **පහක් (05)** මඟින් දක්වන්න. (ලකුණු 10)

13. (i) ශ්‍රී ලංකාවේ ආධාර ලබන පාසල් 1960 දශකයේ දී රජයට පවරා ගනු ලැබීමට පක්ෂව ඉදිරිපත් වූ කරුණු **හතරක් (04)** දක්වන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාව තුළ බ්‍රිතාන්‍ය පාලන සමයෙහි අධ්‍යාපන මාධ්‍යය පිළිබඳව පැවති ද්විත්ව ප්‍රතිපත්තිය කෙටියෙන් විමසන්න. (ලකුණු 06)

(iii) 1945 සිට ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපන මාධ්‍යය මව්බස බවට පත් කිරීමෙහි ප්‍රතිඵල කරුණු **පහක් (05)** ඔස්සේ අගය කරන්න. (ලකුණු 10)

14. (i) 1977 සිට ශ්‍රී ලංකාව තුළ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම සඳහා රජය විසින් ගෙන ඇති පියවර **හතරක් (04)** ලැයිස්තු ගත කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලියෙහි දක්නට ලැබෙන ධනාත්මක ලක්ෂණ **දෙකක් (02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) පාසල් පාදක ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමෙහි දී මතුවී ඇති අභියෝග **දෙකක් (02)** සඳහන් කර, ඒ එක් එක් අභියෝගයට විසඳුම් **දෙක (02)** බැගින් ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.